# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 270/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 14/02/2024<br>පැය 1950 | | |

## මාධ්‍ය නිවේදනය

**මරණීය දණ්ඩනය නියම වූ වරෙන්තුකරුවෙකු අත්අඩංගුවට - වැලිකන්ද පොලිස් ස්ථානය.**

2009.05.16 වන දින වැලිකන්ද පොලිස් වසමේ සෙවනපිටිය දුම්රිය හරස් මාර්ගයේදී ආරක්ෂිත දුම්රිය වැට කඩාගෙන ධාවනය කිරීමෙන් බස් රථය දුම්රියේ ගැටී මගීන් 15 දෙනෙකුට මරණය සිදුකිරීම හා තවත් පුද්ගලයින් 40 දෙනෙකුට බරපතල තුවාල සිදු කිරීම යන චෝදනා වලට වරදකරු වූ බස් රථයේ රියදුරු හට 2023.09.22 වන දින පොළොන්නරුව මහාධිකරණය මගින් නඩුවේ තීන්දුව ලබා දෙමින් මරණීය දණ්ඩනය නියම කර තිබිණි.

මෙම රියදුරු අවසන් වරට 2022.08.05 වන දින ගරු මහාධිකරණයේ පෙනී සිට ඇති අතර ඉන්පසු අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් ඔහු හට වරෙන්තු නිකුත්වී තිබුණි. ඔහු අධිකරණය මග හරිමින් සිටියදී 2024.02.14 වන අද දින උදෑසන කාලයේදී වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැලිකන්ද නගරයේදී අත්අඩංගුවට ගන්නා ලදී.

**අත්අඩංගුවට ගත් වරෙන්තුකරු වයස අවුරුදු 39 වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිකන්ද පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**